# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

**ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින්
2017 ජූනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 පෙබරවාරි මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[185 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

## ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක     දරන ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දුප්පත් අසරණ ජනතාවට මෙන්ම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සහ ආහාර ද්‍රව්‍ය සපයා දීම;

(ආ) ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාර සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම;

(ඇ) පහ වසරේ ශිෂ්‍යත්ව, අ.පො.ස. (සා. පෙළ) හා අ.පො.ස. (උ. පෙළ) විභාග සඳහා පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපන විශේෂඥයන් යොදවා විශේෂ උපකාරක පන්ති පැවැත්වීම;

(ඈ) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටුකරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරිගැන්වීම;

(ඉ) අගහිගකම් ඇති ළමයින්ගේ කුඩා කල ළමා සංවර්ධනය සඳහා පෙර පාසල් සංවර්ධනය සඳහා කටයුතු කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමෙහි ලා යෙදී සිටින යම් නිලධරයකුට හෝ සේවකයකුට ශිෂ්‍යත්ව මගින් ආධාර දීම;

(උ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති මේ හා සමාන සංගම් සමග සහයෝගය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඌ) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාර සේවා නියුක්තිකයින් සංවිධාන ගතකොට ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම;

(එ) ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා පාරිසරික සංවර්ධන කටයුතු ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම හා ඊට අවශ්‍ය උපදේශන සැපයීම;

(ඒ) නාස්තිය හා දූෂණය පිටු දකිමින් අප ප්‍රජාව සතු සියළු සම්පත් ඉතා ප්‍රයෝජනවත් මට්ටමින් උපයෝජනය කිරීම;

(ඔ) ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වූ සමාජ සජීවීකරණ වැඩ සටහන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම, ඒ සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම;

(ඕ) අඩු සමාජතල සහිත පවුල්වල තරුණ තරුණියන්ට ස්වයංරැකියා අවස්ථා ලබා ගැනීමට හැකි වන පරිදි කාර්මික, කර්මාන්ත හා පරිගණක වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා වැඩ සටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ක) කෘෂි කර්මාන්තයේ යෙදී සිටින තරුණ තරුණියන්ට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සහ අපනයන බෝග වගාවන් සඳහා යොමු කිරීම හා ඊට අවශ්‍ය දේශීය හා විදේශීය වෙළෙඳ කටයුතු සංවිධානය කිරීම හා වගාවන් සඳහා අවශ්‍ය ඉඩ ලබා දීම;

(ග) ස්වභාවික ආපදාවල දී හා හදිසි ආපද හා අනතුරුවල දී ආධාර උපකාර කිරීම;

(ච) උසස් අධ්‍යාපනයට හිමිකම් නොලබන තරුණ තරුණියන්ට ඉංජිනේරු, කාර්මික, වඩු කාර්මික, පෙදරේරු, රියදුරු හා පරිගණක ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව ලබා දීම හා ඔවුන් එම වෘත්තීන්වලට යොමු කිරීම හා ඒ සඳහා අවශ්‍ය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම; සහ

(ජ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත්කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඊ) විවිධ සාමාජිකයන් වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, අධ්‍යක්ෂ ජනරාල්, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන හත් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, පැවැරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල් හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද, සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාදෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.